සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය
## (87) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I පත්‍රය

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 03 විනාඩි 10 යි.**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ (X) ලකුණ සටහන් කරන්න.**

---

(1) ''බලපෑම'' නම් මූලිකාංගය පිළිබඳව දැඩි අවධානය යොමු කරමින් සන්නිවේදනය පිළිබඳ අර්ථ දැක්වීම ඉදිරිපත් කළ විද්‍යාඥයා වන්නේ,
(1) විල්බර්ශ්‍රාම් ය. (2) චාල්ස් හෝටන්කූලී ය. (3) ලැස්වෙල් ය. (4) ෂැනන් - වීවර් ය.

(2) අවාචික සන්නිවේදනයේ දී සමාජීය දුර යටතට අයත් වන පුද්ගල කාණ්ඩය, වන්නේ,
(1) ගණුදෙනු කරුවන් ය. (2) නෑදෑයන් ය. (3) පොදු ජනයා ය. (4) මිත්‍රයන් ය.

(3) ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීමට භාවිත කළ හැකි කාර්යාලීය මාධ්‍ය උපකරණය වන්නේ.
(1) ජල මුද්‍රා නිරීක්ෂණ යන්ත්‍රය (2) මුදල් ගණින යන්ත්‍රය
(3) විද්‍යුත් ගණක රාමු යන්ත්‍රය (4) විද්‍යුත් පිරික්සුම් උපකරණය

(4) ජනමාධ්‍ය ආයතනයක ප්‍රතිපත්ති පිළිබඳ පිළිගත හැකි ප්‍රකාශනය තෝරන්න.
(1) වාණිජවාදී අරමුණු සංතෘප්ත නොකරනු ඇත.
(2) මහජන සේවා සංකල්පයම ක්‍රියාත්මක කිරීමට වෙරදරනු ඇත.
(3) ග්‍රාහක රුචි - අරුචිකම් පිළිබඳ දැඩි අවධානයෙන් සිටිනු ඇත.
(4) මාධ්‍යවේදීන්ගේ වෘත්තිය නිදහසට උපරිම සාධාරණයක් කර ඇත.

(5) බොහෝ මාධ්‍ය සංදේශවල සැඟවුණු න්‍යාය පත්‍ර පිළිබඳ අවබෝධය ලබාගත හැක්කේ ග්‍රාහකයා,
(1) නිර්මාණශීලී වීම මඟිනි.
(2) මනා ලෙස සංදේශ ග්‍රහණය කරගැනීම මඟිනි.
(3) සංදේශය ගැන අන්‍යයන් සමඟ සාකච්ඡා කිරීම මඟිනි.
(4) සෑම විටම මාධ්‍ය විචාරයට අනුව කටයුතු කිරීම මඟිනි.

(6) නිශ්චල ඡායාරූප කැමරාව ජංගම උපකරණයක් බවට පත් කළේ,
(1) ලුයිස් මැන්ඩේ ඩිගියුරේ ය. (2) විලියම් ෆොක්ස් ටැල්බොට් ය.
(3) ජෝර්ජ් ඊස්ට්මාන් ය. (4) තෝමස් අල්වා එඩිසන් ය.

(7) එදිනෙදා ජීවිතයේ දී පුද්ගලයෙකුට තොරතුරු දැනගැනීමේ කාර්යය හා ඍජුවම අදාළ **නොවන්නේ,**
(1) නිර්මාණශීලී චින්තනය වර්ධනයට ය. (2) කියවීමේ රුචිය වර්ධනයට ය.
(3) ගැටලු නිරාකරණය කිරීම වර්ධනයට ය. (4) පුද්ගල සම්බන්ධතා ගොඩනැගීම වර්ධනයට ය.

(8) පොත (Book) හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
**දමිත්** :- පොතකට අවම වශයෙන් පිටු (49) තිබීම අවශ්‍යයි.
**සුමිත්** :- දමිත්ගේ ප්‍රකාශය යුනෙස්කෝ අර්ථ දැක්වීමට සමාන යි.
**රුමිත්** :- ලෝකයේ මුල්ම පොත බයිබලයයි.
**ගයනි** :- අප රටේ ISBN අංකය නිකුත් කරන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟිනි.
ඉහත ප්‍රකාශ අතරින්,
(1) දමිත්, සුමිත්, රුමිත් ගේ ප්‍රකාශ සත්‍ය වන අතර, ගයනිගේ ප්‍රකාශය අසත්‍ය වේ.
(2) ගයනි හා රුමිත්ගේ ප්‍රකාශ සත්‍ය වන අතර, දමිත් හා සුමිත්ගේ ප්‍රකාශ අසත්‍ය වේ.
(3) දමිත්, සුමිත්, රුමිත් හා ගයනි යන සිව්දෙනාගේම ප්‍රකාශ සත්‍ය වේ.
(4) දමිත්, සුමිත්, ගයනිගේ ප්‍රකාශ සත්‍ය වන අතර, රුමිත්ගේ ප්‍රකාශය අසත්‍ය වේ.

9) රාජ්‍ය ගුවන්විදුලි ප්‍රවෘත්ති සඳහා විදෙස් පුවත් සපයාගන්නේ,
   (1) රොයිටර් පුවත් සේවය, ප්‍රංශ පුවත් සේවය, අන්තර්ජාලය මගිනි.
   (2) යුනයිටඩ් ප්‍රෙස් ඉන්ටර්නැෂනල් හා ප්‍රංශ පුවත් සේවය මගිනි.
   (3) ඇසෝසියේටඩ් ප්‍රෙස් හා රොයිටර් පුවත් සේවය මගිනි.
   (4) ඕනෑම අනතර්ජාතික පුවත් සේවාවලින් හා වෙබ් අඩවි මගිනි.

(10) සිනමා කර්මානතයේ නිර්මාණාත්මක වෘත්තීය ක්ෂේත්‍රයට අදාළ **නොවන්නේ,**
   (1) අධීක්ෂණ ක්‍රියාවලිය යි. (2) තිරපිටපත් රචනය යි.
   (3) නිෂ්පාදන ක්‍රියාවලිය යි. (4) වේෂනිරූපණය යි.

(11) පෞද්ගලික මෙනම ආගමික නායකත්වයට හිමිකාරත්වයක් සහිත ගුවන්විදුලි සේවයකි,
   (1) ලේක්හවුස් ආයතනය (2) ලක්හඬ ගුවන්විදුලිය
   (3) ස්වාධීන රූපවාහිනී ආයතනය (4) රංගිරි ශ්‍රී ලංකා ගුවන්විදුලිය

(12) අන්තර් ක්‍රියාකාරී පුවරුව සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
   (1) කළු ලෑල්ලට වඩා තරමක් විශාල පුවරුවකි.
   (2) පංති කාමර මාධ්‍ය උපකරණ අතර වඩාත් දියුණුම උපකරණයකි.
   (3) පරිගණක යතුරු පුවරුව යොදාගෙන අකුරු යෝජනය කළ හැකිය.
   (4) මවුසය වෙනුවට ඇඟිල්ල ස්පර්ශ කරමින් උපකරණය ක්‍රියාත්මක කළ හැකිය.

(13) අසල්වැසි නිවසකට දෙවියන්ගේ ලෙඩ වැළඳී ඇති බව ගීතා නීතාට ද, ගීතා සීතාට ද, සීතා ශීලාට ද පැවසුවාය. මෙය අයත්වන්නේ,
   (1) ඕපාදූප දාමයටය. (2) රෝද දාමයටය.
   (3) තනි දාමයටය. (4) Y ආකෘතියටය.

(14) සාමාන්‍ය පෙළ ශිෂ්‍යයන් තිදෙනෙක් අතර පුද්ගලාන්තර සන්නිවේදනය පිළිබඳ ඇති වූ සංවාදයක දී මතු වූ අදහස් පහත දක්වේ.
   **A සිසුවා** :- පුද්ගලාන්තර සන්නිවේදනය අඛණ්ඩ හා ගතික ක්‍රියාවලියකි.
   **B සිසුවා** :- පුද්ගලාන්තර සන්නිවේදනය වෙනස් කළ නොහැකි ක්‍රියාවලියකි.
   **C සිසුවා** :- නැවත නැවතත් සිදුකළ හැකි ක්‍රියාවලියකි.
   ඉහත ප්‍රකාශවලින් පුද්ගලාන්තර සන්නිවේදනය හා සමීප අදහස් පළකර ඇත්තේ,

(1) A හා B යන සිසුන්ය. (2) A හා C යන සිසුන්ය.
   (3) B හා C යන සිසුන්ය. (4) A, B හා C යන සිසුන්ය.

(15) ජලය හා තෙල් මිශ්‍ර නොවීමේ මූලධර්මය මත පදනම් වූ මුද්‍රණ ක්‍රමය,
   (1) උත්තල මුද්‍රණ ක්‍රමය යි. (2) ඩිජිටල් මුද්‍රණ ක්‍රමය යි.
   (3) සමතල මුද්‍රණ ක්‍රමය යි. (4) ලේසර් මුද්‍රණ ක්‍රමය යි.

(16) මාධ්‍ය නියෝජනය සම්බන්ධයෙන් **නිරවද්‍ය** වගන්තිය තෝරන්න.
   (1) වර්තමාන ජනමාධ්‍ය විසින් පවුලේ සියලු භූමිකා ගෘහස්ථ (Domestic) හා විචිත්‍රාද්භූත (Romantic) තත්ත්වයට පත්කර ඇත.
   (2) ප්‍රධාන මාධ්‍ය වාර්ගිකත්වය පිළිබඳ නොසැලකීම අද දවසේ වාර්ගික නාලිකා බිහිවීමට හේතුවී ඇත.
   (3) ස්ත්‍රී පුරුෂ සමාජභාවය මනෝ විද්‍යාත්මක සංකල්පයක් ලෙස ප්‍රචලිත වී ඇත.
   (4) වෘත්තීන් පිළිබඳ සමාජ ආකල්ප වෙනස් කිරීමේ ජනමාධ්‍යවලට ඇති හැකියාව අවම මට්ටමේ පවතිනු ඇත.

(17) ගුවන් විදුලි මාධ්‍යයේ ප්‍රබලතාවයකි,
   (1) සංකීර්ණ අදහස් ග්‍රාහකගත කිරීමට ඇති හැකියාව.
   (2) අතිශය ක්ෂණික මාධ්‍යයක් වීම.
   (3) ශබ්දය පාදක වූ මාධ්‍යයක් වීම.
   (4) එක්වරක් පමණක් ශ්‍රවණය වන මාධ්‍යයක් වීම.

(18) ශ්‍රව්‍ය මාධ්‍යයේ ආරම්භය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) සෙවණැලි නාට්‍ය ප්‍රදර්ශනය කිරීම. (2) මැජික් ලන්තෑරුම සොයාගැනීම.
   (3) දෘෂ්ටියේ අඛණ්ඩතාවය සොයාගැනීම. (4) මෝස් සංඥා ක්‍රමය සොයාගැනීම.

(19) නිශ්චල ඡායාරූපකරණයට යොදාගන්නා කැමරා වර්ග සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ඩිජිටල් කැමරාවට සේයාපටල අවශ්‍ය නැත.
(2) ශ්‍රමායික කැමරා සඳහා බැටරි අවශ්‍ය නොවනු ඇත.
(3) SLR කැමරාවේ කාච මාරු කිරීම කළ නොහැකි වනු ඇත.
(4) මෙමරි කාඩ් ක්‍රමය නිසා විශාල ඡායාරූප ප්‍රමාණයක් ගැනීමට හැකි වී ඇත.

(20) ලී බ්ලොක් මගින් සිංහල අකුරු කපා පොතක් මුල්වරට නිර්මාණය කළ ලන්දේසි ජාතිකයා,
(1) ග්‍රේබියෙල් ස්කේද් ය. (2) රුවල් ය. (3) පිලාත් ය. (4) ගුටෙන්බර්ග් ය.

(21) media.ncert@nic.in මෙය,
(1) විද්‍යුත් තැපැල් ලිපිනයකි. (2) වෙබ් අඩවියකි.
(3) සෙවුම් යන්ත්‍රයකි. (4) විද්‍යුත් සේවා සපයන ආයතනයකි.

(22) අක්ෂි සම්බන්ධතාව පවත්වන ප්‍රදීපාගාර උපක්‍රමයේ දී ඊට සම්බන්ධ වන පාර්ශව දෙක,
(1) ග්‍රාහකයා හා සෙසු ග්‍රාහකයන් ය. (2) කථිකයා හා ග්‍රාහකයන් ය.
(3) ග්‍රාහකයන් හා කථිකයන් ය. (4) කථිකයා හා සෙසු කථිකයන් ය.

(23) භාෂාවේ මූලික කාර්යයක් **නොවන්නේ,**
(1) දැනුම සංරක්ෂණය කිරීම. (2) යථාර්ථය හඳුනාගැනීම.
(3) චින්තනය විධිමත් කිරීම. (4) සමාජ සුපරීක්ෂාව කිරීම.

(24) මාධ්‍ය ආයතනයක් දූන්වීම්කරණය මගින්,
(A) සමාජීය අවශ්‍යතා ඉටු කරගනී.
(B) ව්‍යාපාරික අවශ්‍යථා ඉටු කරගනී.
(C) යහපත් ආකාරයේ පෙළඹවීමක් ඇති කරගනී.
(D) ජනතාවගේ මතවාද වෙනස් කරනු ඇත.
ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,
(1) A, B, හා C පමණි. (2) A, C හා D පමණි. (3) A, B හා D පමණි. (4) B, C හා D පමණි.

(25) සංඛ්‍යාංක (Digital) ඡායාරූපයක් සෑදී තිබෙන කුඩා අංශු රාශිය,
(1) කිලෝබයිට් නම් වේ. (2) ගහණතාව නම් වේ.
(3) පික්සල් නම් වේ. (4) මෙගා පික්සල් නම් වේ.

(26) පහත ප්‍රකාශවලින් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) මානව ධර්මතා යටතට ඉවසීම, කරුණාව, උපකාර කිරීම ද ඇතුළත් වේ.
(2) මානසික හා භෞතික වශයෙන් ද සමාජය තුළ ගැටුම් ඇති වේ.
(3) ශ්‍රව්‍ය මාධ්‍ය ගුවන්විදුලි රඟමඩලට වැඩි තැනක් ලබා දී ඇත්තේ එය ජනයාගේ ප්‍රධාන විනෝදාස්වාදක ප්‍රභවයට ඇතුළත් වන නිසාය.
(4) සෞන්දර්ය අංශයට ප්‍රධානස්ථානයක් හිමිවන්නේ ජනයාගේ සමාජ විඥානය පෝෂණය කරන නිසාය.

(27) ''සෑම උද්වේගකර ආරංචියක් ම ප්‍රවෘත්තියක් වේ''. මෙමගින් අදහස් වනුයේ,
(1) ජනයා තුළ දැඩි පෙළඹවීමක් ඇති කරන ඕනෑම තොරතුරක් ප්‍රවෘත්තියක් විය හැක.
(2) ජනයා තුළ සියුම් මනෝවිද්‍යාත්මක වින්දනයක් ලබාදෙන ඕනෑම තොරතුරක් ප්‍රවෘත්තියක් විය හැක.
(3) ජනයා ගැටුමකට පමණක් පොළඹවන ඕනෑම තොරතුරක් ප්‍රවෘත්තියක් විය හැක.
(4) ජනයාගේ අවධානයෙන් බැහැර වන ඕනෑම තොරතුරක් ප්‍රවෘත්තියක් විය හැක.

(28) පැරණි මුද්‍රණ ශිල්පය හා නූතන මුද්‍රණ ශිල්පය සොයා ගන්නා ලද්දේ,
(1) චීන ජාතිකයන් හා මිසර ජාතිකයන් විසිනි. (2) ජර්මනි ජාතිකයන් හා චීන ජාතිකයන් විසිනි.
(3) චීන ජාතිකයන් හා ජර්මන් ජාතිකයන් විසිනි. (4) බ්‍රිතාන්‍ය ජාතිකයන් හා චීන ජාතිකයන් විසිනි.

(29) පුද්ගලයාගේ රසවින්දනයට වැඩිම බලපෑමක් කරන මාධ්‍ය,
(1) රූපවාහිනිය යි. (2) ගුවන්විදුලිය යි. (3) සමාජ ජාලය යි. (4) පුවත්පත යි.

(30) නිර්වාචික සන්නිවේදනයේ බොහෝ අංගයන් තාත්විකව භාවිත කළ හැකි මාධ්‍ය විශේෂයකි.
(1) චලන චිත්‍රය (2) රූපවාහිනිය (3) ගුවන්විදුලිය (4) පුවත්පතය

(31) එක්තරා ගුවන්විදුලි වැඩසටහනක පහත ලක්ෂණ පෙන්නුම් කළේ ය.

A - ශිල්පීන් දෙදෙනෙක් සහභාගි වේ.

B - එකම ක්ෂේත්‍රය ගැන කථා කරයි.

C - පෝෂණය වන අදහස් ඉදිරිපත් කිරීම සම්ප්‍රදායකි.

මෙම ගුවන්විදුලි වැඩසටහන විය හැක්කේ,

(1) වාර්තාකථනය කි. (2) විචිත්‍රාංගය කි. (3) සංවාදය කි. (4) සජීවී විස්තර විචාරය කි.

(32) ප්‍රාග් මුද්‍රිත මාධ්‍ය ස්වරූපයකි.

(1) ලාගැසතේ පුවත්පත (2) වජ්‍ර සූත්‍රය (3) ලතින් බයිබලය (4) ඉයෝමියුරි මැට් පුවරුය.

(33) ''ප්‍රවෘත්ති යනු ජනතාවට බලපාන්නාවූත්, ඔවුන් තුළ උනන්දුවක් ඇති කරන්නාවූත්, මෑත කාලීන වැදගත් සිදුවීමකට අදාළ අලුත් තොරතුරකි.....'' මෙම අර්ථ දැක්වීම ඉදිරිපත් කළේ,

(1) පෝල් D මැසිනියර් ය. (2) චාල්ස් ඇන්ඩසන් ඩානා ය.

(3) මිල්ටන් බ්‍රෂ් ය. (4) විල්බර් ශ්‍රාම් ය.

(34) (A) මුහුණේ ශෝකී බව හෝ සතුට

(B) කුරුළු කූඩුවක සිටින කුරුළු පැටව් කූඩුවෙන් වැටීම.

(C) ත්‍යාග ප්‍රදානෝත්සවයක සමූහ ඡායාරූපය

(D) අකුරු ලියන ළමයෙකුගේ සමීප ඡායාරූපය

ඉහත අවස්ථා රූපගත කර ගැනීම උදෙසා ඡායාරූප ශිල්පියා භාවිත කළ යුතු කාච වර්ග අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) සාමාන්‍ය කාචය - යුහුඹු කාචය - දුරරූප කාචය - පුළුල් කෝණ කාචය

(2) යුහුඹු කාචය - දුරරූප කාචය - පුළුල් කෝණ කාචය - සාමාන්‍ය කාචය

(3) යුහුඹු කාචය - සාමාන්‍ය කාචය - පුළුල් කෝණ කාචය - දුර රූප කාචය

(4) දුර රූප කාචය - යුහුඹු කාචය - පුළුල් කෝණ කාචය - සාමාන්‍ය කාචය

(35) දිනපතා පුවත්පතක මුල් පිටුවේ ප්‍රධාන ප්‍රවෘත්ති නියෝජනය සම්බන්ධව අදාළ **නොවන්නේ,**

(1) දේශපාලන කටයුතු පිළිබඳ නියෝජනය (2) නිර්මාණාත්මක ලේඛන කටයුතු පිළිබඳ නියෝජනය

(3) සංවර්ධන කටයුතු පිළිබඳ නියෝජනය (4) ජාත්‍යන්තර කටයුතු පිළිබඳ නියෝජනය

(36) ඔබගේ පාසල් කාර්යාලය තුළ භාවිත කළ හැකි තොරතුරු හුවමාරු උපකරණයක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

(A) - රැහැන් රහිතව තොරතුරු හුවමාරු කළ හැකිය.

(B) - කෙටි ලිඛිත/ සංඥා යැවීමට භාවිත කරයි.

(C) - එක ආරම්භක ස්ථානයකින් වැඩි ගමනාන්ත සංඛ්‍යාවකට එකවර සන්දේශයක් යැවිය හැක.

(D) - වර්තමානයේ අත්‍යවශ්‍ය ම ස්ථානවල පමණක් භාවිත වන උපකරණයකි.

මෙම ලක්ෂණ සියල්ල සහිත තොරතුරු හුවමාරු උපකරණය

(1) රෝනියෝ යන්ත්‍රය නම් වේ. (2) ෆැක්ස් යන්ත්‍රය නම් වේ.

(3) විද්‍යුත් පිරික්සුම් උපකරණය නම් වේ. (4) පේජරය නම් වේ.

(37) රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍යවල ලක්ෂණ සංසන්දනය කරන විට පෞද්ගලික මාධ්‍යවල ප්‍රමුඛ ලක්ෂණය වන්නේ.

(1) රජයට පක්ෂග්‍රාහී වීම. (2) සමාජ වගකීමෙන් ක්‍රියාත්මක වීම.

(3) වාණිජ පරමාර්ථ මුල් කරගැනීම. (4) රජයට පූර්ණ සහයෝගය දැක්වීම.

(38) නිර්වාචික සන්නිවේදනය වාචික සන්නිවේදනයට වඩා ප්‍රබල වන්නේ,

(1) භාෂාවක් මත පදනම් නොවන නිසා ය. (2) වාග්මාලාවේ සුභාවිත බව නිසා ය.

(3) අර්ථ ගැන්වීම නිසා ය. (4) ව්‍යාකරණ රීති ඇති නිසා ය.

(39) සෙවනැලි රූප (Silhouette) සෙවනැලි නාට්‍ය නම් ප්‍රසංගය බවට පත් කරන ලද්දේ,

(1) චීන ජාතිකයන් ය. (2) ඇමරිකයන් ජාතිකයන් ය.

(3) බ්‍රිතාන්‍ය ජාතිකයන් ය. (4) මිසර ජාතිකයන් ය.

(40) අභිනවයෙන් ඉදි කරන ලද බෙලිඅත්ත දුම්රිය ස්ථානයේ ඔබ දුම්රියක් පැමිණෙන තුරු බලා සිටින්නේ යැයි උපකල්පනය කරන්න. එහි දී දුම්රිය ස්ථානයේ රැඳී සිටින මගීන් පිරිසක් සමඟ ඔබ රටේ පවත්නා වර්තමාන තත්ත්වය ගැන කථා බස් කරමින් සිටියේ ය. මෙහි දී ඇතිවන සන්නිවේදනය,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනයකි. (2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයකි.

(3) විධිමත් සන්නිවේදනයකි. (4) අවිධිමත් සන්නිවේදනයකි.

(ල: 1×40= 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය
## (87) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II පත්‍රය

**නම/විභාග අංකය :-- ..................................................................................**

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව තවත් ප්‍රශ්න හතරක් සමඟ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර, අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමිවේ.**

(01) සියලු මිනිසුන් එකිනෙකාට ගරු කරන දවසක් වේ ද? ඒ තුළින් ලෝකයේ සියලු ගැටුම් නිමාවන බව සර්ව ආගමික නායකයින් යූ FM මාධ්‍ය ජාලය ඔස්සේ ප්‍රකාශ කළේ ය.

(1) ජනමාධ්‍ය අයත්වන සන්නිවේදන වර්ගය නම් කරන්න.
(2) අතීතයේ ආගමික මත ප්‍රචාරය කිරීමට යොදාගත් සන්නිවේදන ප්‍රභේදයේ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
(3) මිනිස් දිවියේ ඇති වටිනාකම සම්බන්ධ ආගමික මතවාදයන් සඳහා වෙබ් අඩවියක් යූ FM මාධ්‍ය ජාලය විවෘත කළේ ය. වෙබ් අඩවියක් පවත්වාගෙන යාමෙන් අත්පත් කරගත හැකි වාසි **දෙකක්** ලියන්න.
(4) යූ FM ගුවන්විදුලි නාලිකාවේ ඇති අංශ **දෙකක** ක්‍රියාකාරිත්වය කෙටියෙන් හඳුන්වන්න.
(5) ආගමික ගැටුමක දී පුරවැසියා ක්‍රියා කළ යුතු ආකාර **දෙකක්** ලියන්න.
(6) සර්ව ආගමික නායකයන්ගේ මාධ්‍ය සාක්ච්ඡාවේ දී යූ FM මාධ්‍ය ජාලයේ කැමරාකරුවකු ප්‍රවෘත්ති ඡායාරූපයක් ගන්නා ලදී. මෙහි **''ප්‍රවෘත්ති ඡායාරූපය''** යන්නෙහි අර්ථය ප්‍රකාශ කරන්න.
(7) සර්ව ආගමික නායකයන් මෙම මාධ්‍ය සාකච්ඡාවේ දී වැදගත් තොරතුරු ගණනාවක්. සමාජයට ප්‍රකාශ කරන ලදී. එවැනි තොරතුරු දැනගැනීමේ අවශ්‍යතා **දෙකක්** ලියන්න.
(8) යූ FM මාධ්‍ය ජාලය භාවිතා කරනු ලැබේ යැයි සිතිය හැකි මුද්‍රිත මාධ්‍ය ස්වරූප **හතරක්** නම් කරන්න.
(9) යූ FM ගුවන්විදුලි නාලිකාව සතු **ප්‍රභලතාවක්** සහ **දුබලතාවක්** සඳහන් කරන්න.
(10) යූ FM මාධ්‍ය ජාලයේ රූපවාහිනී විකාශය අංකිත රූපවාහිනී තාක්ෂණය භාවිත කරමින් සිය විකාශ කටයුතු කරගෙන යනු ඇත. මෙම තාක්ෂණ ක්‍රමය භාවිත කිරීමේ වාසියක් පෙන්වා දෙන්න.

(ල : 2 × 10 = 20)

(02) සන්නිවේදන ක්‍රියාවලි මෙහෙයවීමේ දී විවිධ සන්නිවේදන ප්‍රභේද හා ස්වරූප වැදගත් වන අතර, මෙම ක්‍රියාවලිය සිදුවන ආකාරය ආකෘතින් මගින් මනාව පැහැදිලි කළ හැකිය.

(1) ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය හා ෂැනන් - වීවර් ආකෘතිය අතර වූ **සමානතාවක්** හා **අසමානතාවක්** ලියන්න. (ලකුණු 01)
(2) සන්නිවේදන ක්‍රියාවලිය ද්විමාර්ගික වීමෙන් ලැබිය හැකි වාසි **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)
(3) පුද්ගලාන්තර සන්නිවේදනය සාර්ථක කරගැනීමට භාවිත කළ හැකි නිර්වාචික සන්නිවේදන ක්‍රම **තුනක්** නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 03)
(4) රූපවාහිනී මාධ්‍ය භාවිතයේ දී ඇති විය හැකි සන්නිවේදන බාධක වර්ග **දෙක** නිදසුන් සහිතව වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(03) වර්තමාන මුද්‍රණ කාර්යයන් සඳහා පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය (DTP) බහුල ව භාවිත වේ. යූ FM ජනමාධ්‍ය නාලිකාව ද සිය දෛනික කටයුතුවල දී මෙම පරිගණක ක්‍රියාව යොදාගනු ඇත.

(1) පරිගණකය සැදීමට භාවිත කරන දෘඩාංගයක් හා මෘදුකාංගයක් නම්කරන්න. (ලකුණු 01)
(2) පිරිස 100 දෙනෙකුට කොටස් හිමි සමාගමක් යූ FM මාධ්‍ය ජාලය එහි වාර්ෂික ගිණුම් වාර්තාව ඔවුන්ට ලබාදීමට භාවිත කළ යුතු පරිගණක ආශ්‍රිත ප්‍රකාශන උපකරණය නම් කර, එහි ක්‍රියාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)
(3) ''පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ අවශ්‍යතාව'' මැයෙන් කරුණු **තුනක්** යොදාගනිමින් ඉරිදා පුවත්පතකට තීරු ලිපියක් රචනා කරන්න. (ලකුණු 03)
(4) යූ FM ජනමාධ්‍ය නාලිකාව, පවතින ආණ්ඩුව සමඟ සමීප සම්බන්ධකම් පවත්වයි. මාධ්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ ඍජු හා වක්‍ර මැදිහත්වීම් **දෙක** බැගින් **හතරක්** වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(04) ජනමාධ්‍ය විසින් කරන මාධ්‍ය නියෝජන ක්‍රියාවලිය සමාජයේ සංවර්ධනය උදෙසා නිතැතින් ම බලපානු ඇත.

(1) ''**පුරවැසිභාවය**'' යන්න අර්ථ දක්වන්න (ලකුණු 01)

(2) පුරවැසියකු රටේ සාමය පවත්වාගෙන යාමට සිය දායකත්වය සැපයිය යුතුය. සමාජ සාමය ශක්තිමත් කිරීමට ජනමාධ්‍ය සතු කාර්යභාරයන් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(3) මුද්‍රිත මාධ්‍යය සඳහා ඡයාරූප භාවිතයෙන් ලැබෙන වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 03)

(4) නිශ්චල ඡයාරූප ගැනීමේ දී අනුගමනය කළ යුතු ආචාරධර්මයන් **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04)

(05) (1) ''නූතන ජනසන්නිවේදන ප්‍රවණතාවක් වන්නේ අභිසාරී මාධ්‍ය කලාවයි....'' ඔබ මේ ප්‍රකාශයට එකඟවන්නේ ද? **හේතුවක්** සපයමින් ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 01)

(2) විධිමත් සන්නිවේදනය අවිධිමත් සන්නිවේදනයට වඩා වෙනස් රටාවකින් යුක්ත වන්නකි. ඔබ මේ ප්‍රකාශයට එකඟ වේ ද? හේතු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(3) මාධ්‍යවේදියෙකු තමන්ට අවශ්‍ය තොරතුරු සපයාගන්නේ එකම මූලාශ්‍රයකිනි. ඔබ මේ ප්‍රකාශයට එකඟ වේ ද? හේතු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(4) රූපවාහිනී මාධ්‍ය හා ගුවන්විදුලි මාධ්‍ය එක සමාන ලක්ෂණවලින් යුක්ත මාධ්‍ය වර්ග දෙකකි. ඔබ මේ ප්‍රකාශය හා එකඟ වන්නේ ද? හේතු **හතරක්** ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 04)

(06) මුද්‍රිත මාධ්‍ය මඟින් බොහෝ තොරතුරු සංරක්ෂණය කරගැනීමට හැකිවීම සන්නිවේදන ක්‍රියාවලියට ලැබුණු විශාල පිටුවහලකි.

(1) ප්‍රාග් මුද්‍රිත මාධ්‍ය ස්වරූප **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(2) මුද්‍රණ තාක්ෂණය සොයාගැනීමත් සමඟ ලිඛිත සන්නිවේදනයට සිදුවූ වාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(3) සංස්කාරක වැකිය/ කතු වැකිය මඟින් පාඨකයාට ලැබෙන වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 03)

(4) මුද්‍රිත පුවත්පතට ඉතා හොඳ ආදේශකයක් ලෙස විද්‍යුත් පුවත්පත යන්න දැක්විය හැක. විද්‍යුත් පුවත්පතෙහි මූලික ලක්ෂණ **හතරක්** සවිස්තරව දක්වන්න. (ලකුණු 04)

(07) (1) තොරතුරු රැස්කිරීමේ ශිල්පීය ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(2) පුද්ගලයෙකුට ගුවන්විදුලිය පරිශීලනය කිරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(3) ගුවන්විදුලි පිටපතක් රචනයේ දී ශබ්ද ස්වරූපය, ශ්‍රවණ ස්වරූපය, ආමන්ත්‍රණ ස්වරූපය යොදාගත යුත්තේ කෙසේ දැයි? කරුණු **තුනක්** නිදසුන් වශයෙන් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 03)

(4) රූපවාහිනී මාධ්‍යයේ සමාජ බලපෑම් **හතරක්** සවිස්තරව දක්වන්න. (ලකුණු 04)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## (87) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය (බහුවරණ)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | (3) | 11. | (4) | 21. | (1) | 31. | (3) |
| 02. | (1) | 12. | (3) | 22. | (2) | 32. | (4) |
| 03. | (2) | 13. | (2) | 23. | (4) | 33. | (3) |
| 04. | (3) | 14. | (2) | 24. | (3) | 34. | (2) |
| 05. | (4) | 15. | (3) | 25. | (2) | 35. | (2) |
| 06. | (3) | 16. | (2) | 26. | (3) | 36. | (4) |
| 07. | (2) | 17. | (2) | 27. | (1) | 37. | (3) |
| 08. | (4) | 18. | (4) | 28. | (3) | 38. | (1) |
| 09. | (1) | 19. | (3) | 29. | (2) | 39. | (1) |
| 10. | (2) | 20. | (2) | 30. | (1) | 40. | (4) |

(ලකුණු 1 × 40 = 40)

### ලකුණු බෙදී යන ආකාරය

I කොටස = ලකුණු 1 × 40 = 40

II කොටස = (01) ප්‍රශ්නයට = 20 }
(02 - 07) ප්‍රශ්නයට = 40 } 60
(10 × 4)

(I + II) = 60 + 40
= 100%

### II පත්‍රය

1 **පළමු** ප්‍රශ්නය අනිවාර්ය වන අතර, පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න **හතරක්** සමග ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1 පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 හිමිවන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

| ප්‍රශ්න අංකය | විස්තරය | ලකුණු බෙදී යන අයුරු |
|---|---|---|
| **01. ප්‍රශ්නය** (ලකුණු 20) | | |
| (1) | ජන සන්නිවේදනය | ලකුණු 02/0 |
| (2) | සමූහ සන්නිවේදනයේ ලක්ෂණ ලිවීම අපේක්ෂා කෙරේ. | ලකුණු 02/ 01/ 0 |
| (3) | වේගවත් සන්නිවේදනයකට/ තොරතුරු යාවත්කාලීන කිරීමට/ කාර්යයන් සමාජයට විවෘත කිරීමට/ කටයුතු විධිමත්ව හා පිළිවෙළකට කිරීමට/ මහජන සම්බන්ධතා කටයුතු සාර්ථක කිරීමට | ලකුණු 02/01/0 |
| (4) | **ප්‍රවෘත්ති අංශය** = එදිනෙදා සමාජ සිදුවීම් වාර්තා කිරීම.<br>**වැඩසටහන් අංශය** = ළමා, සංගීත, ආගමික ආදී වැඩසටහන් විකාශය | ලකුණු 02/01/0 |
| (5) | ගැටුම නිරාකරණයට මැදිහත් වීම/ නීතියට අනුවම ක්‍රියාත්මක වීම/ සාමය කඩ කරන අයවළුන් ආරක්ෂක අංශවලට භාරදීම/ සාමය ආරක්ෂා කිරීම පිළිබඳ මත සමාජයට ප්‍රවේශ කිරීම/ රාජ්‍යයට අවනත වීම. | ලකුණු 02/01/0 |
| (6) | ප්‍රවෘත්තිමය ගුණාංග අන්තර්ගත ඡයාරූපය | ලකුණු 02/0 |
| (7) | පුද්ගල අවශ්‍යතා හා සමාජ අවශ්‍යතා | ලකුණු 02/01/0 |
| (8) | පොත්/ පුවත්පත්/ සඟරා/ පෝස්ටර්/ අත්පත්‍රිකා | ලකුණු 1/2 × 4 = 2 |

(9) **ප්‍රබලතා** = අතිශය කාර්යක්ෂම මාධ්‍යයක් වීම/ එසැනින් ඇසීමට යොමු වීම./ ශ්‍රාවකයාට පහසුවෙන් සම්බන්ධ වීම/ භූගෝලීය මාධ්‍ය විරල වීම/ අඩු වියදම් මාධ්‍යයක් වීම/ පහසුවෙන් හැසිරවිය හැකි මාධ්‍යයක් වීම. — ලකුණු 02/ 1/0

**දුබලතා** = ශබ්දය පමණක් පාදක වූ මාධ්‍යයක් වීම/ එක්වරක් පමණක් ඇසීම/ අවධාරණයෙන් ඉවතට ඉක්මණින් යොමු වීම/ ගැඹුරු සංකීර්ණ අදහස් ප්‍රයෝජනයට අපහසු වීම.

(10) රූපයේ පැහැදිලි බව වැඩිවීම/ වැඩි රූපවාහිනී නාලිකා ප්‍රමාණයක් විකාශයට හැකිවීම / TV එක ජංගම උපකරණයක් වීම. — ලකුණු 02/ 0

(ලකුණු 2 x 10 = 20)

**(02) ප්‍රශ්නය (ලකුණු 10)**

(1) **සමානතා** = ප්‍රධාන සන්නිවේදන මූලිකාංග අවම 04ක් වත් තිබීම/රේඛීය ආකෘතියක් **ලියා දක්වීමට** වීම/ ප්‍රතිපෝෂණය නොමැති වීම. — ලකුණු 1/2 × 2 = 1

**අසමානතා** = බලපෑම ඇති නැති බව/ බාධක ඇති නැති බව/ තාක්ෂණය යොදාගැනීම/ යොදානොගැනීම.

(2) පණිවිඩය ලැබීම නිශ්චිත බව දැනගැනීමට/ සංදේශයේ අඩුපාඩු හඳුනාගැනීමට/ සන්නිවේදන බාධකවල ස්වභාවය දැනගැනීමට හැකිවීම/ සංදේශය ප්‍රතිසංවිධානයට / S Õ R සම්බන්ධය අඛණ්ඩව පවත්වා ගෙන යෑමට — **කෙටියෙන් විස්තර කිරීමට පමණි.**

ලකුණු 1/2 × 4 = 2

**නම් කිරීමට ලකුණු නොමැත.**

(3) ශාරීරික ඉරියව්/ මුහුණේ ඉරියව්/ අක්ෂි චලන / හඬ උච්ඡාරණය/ නිහඬ බව ඇඳුම් පැළඳුම්/ ස්පර්ශය/ හරහාෂාව/ සංඥා - සංකේත භාවිතය — **නම් කිරීමට පමණක්** ලකුණු 1/2 × 3 = 1 1/2

**විස්තරයට පමණි.** ලකුණු 1 × 3 = 3

(4) **අර්ථබාධක** = විදග්ධ භාෂා/ උපභාෂා/ ප්‍රාදේශීය භාෂා/ මිශ්‍ර භාෂා භාවිතය

**මාධ්‍යබාධක** = විදුලිය විසන්ධි වීම/ උපකරණ සුසර නොවීම/ වැරදි රූප භාවිතය රූප බොඳ වීම. — **විස්තරයට පමණි.** ලකුණු 2 × 2 = 4

**(03) ප්‍රශ්නය (ලකුණු 10)**

(1) **දෘඪාංග** = මොනිටරය/ මවුසය/ CPU/ CD තැටි ධාවකය/ යතුරු පුවරුව මුද්‍රණ යන්ත්‍රය — **විස්තර කිරීමට පමණි** ලකුණු 2 × 2 = 4

**මෘදුකාංග** = Adobe PageMaker/ Word/ Corel Draw... වැනි නිවැරදි වෙනත් මෘදුකාංගයක්.

(2) ඩිජිටල් ඩුප්ලිකේටරය හා එහි ක්‍රියාව පැහැදීම. (ඩුප්ලෝ යන්ත්‍රය ලෙස නම් කළ විට ලකුණු ප්‍රදානයෙන් වළකින්න.) — **උපකරණය නම් කිරීම** ලකුණු 01

**ක්‍රියාව විස්තරයට = 1**

මුළු එකතුව = 02

(3) අඩු පිරිවැය/ ආකර්ෂණීය නිමාව/ ඉක්මන් බව/ පහසුව/ කාර්යාක්ෂමතාව.... යන කරුණු තීරු ලිපියක ආකාරයට විස්තර කළ යුතුය. — **විස්තරයට පමණක්** ලකුණු 1 × 3 = 3

**(නම් කිරීමට ලකුණු නොමැත.)**

(4) **ඍජු** = අණපනත් පැනවීම/ නීති රීති රෙගුලාසි පැනවීම/ මාධ්‍ය ආයතන තහනම් කිරීම./ බදු අය කිරීම./ රාජ්‍ය මාධ්‍ය ආයතතන පරිපාලනය කිරීම. — **පැහැදිලි කිරීම** ලකුණු 1 × 4 = 4

**වක්‍ර** = ආචාර ධර්ම පැනවීම/ පුවත්පත් පැමිණිලි / කොමිසමේ ක්‍රියාව/ වරප්‍රසාද ලබාදීම/ පහරදීම/ ඝාතනය/ තර්ජනය කිරීම. — යටත් පිරිසෙන් මාතෘකාවකින් කරුණු කරුණු දෙකක් ලිවිය යුතුය.

**(04) ප්‍රශ්නය (ලකුණු 10)**

| | | |
|---|---|---|
| (1) | නීත්‍යානුකූල දේශ සීමාවක් තුළ නීත්‍යානුකූලව ජීවත්වන පුද්ගලයා | **අර්ථ දැක්වීමට**<br>ලකුණු 1/ 0 |
| (2) | සාමයේ වැදගත්කම පහදා දීම/ සාමය කඩකරන අය හෙළි කිරීම/ ගැටුමේ නිසරුකම පෙන්වා දීම/ සියලු පාර්ශවවල මත සමාජය අභිමුඛට ගෙන ඒම/ සංහිඳියාව වර්ධනයට වැදගත් වැඩසටහන් ප්‍රචාරය කිරීම. | **කෙටියෙන් පැහැදිලි කිරීමට**<br>ලකුණු 1 × 2 = 2 |
| (3) | අදහස් ප්‍රභලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව/ විශ්වසනීයත්වය දිනාගැනීම/ ග්‍රාහක ආකර්ෂණය දිනාගැනීමට හැකිවීම/ පහසුවෙන් මුද්‍රණ තාක්ෂණයට අනුගත වීමට හැකියාව/ පහසුවෙන් තේරුම් ගැනීමට හැකිවීම. | **නම් කිරීමට**<br>ලකුණු 1/2 × 3 = 1 1/2<br>**විස්තර කිරීමට**<br>ලකුණු 1 × 3 = 3 |
| (4) | රැවටීම් නොකිරීම/ අන් අයට හිංසා නොකිරීම/ පහත් රුචිකත්වයට ඇඳ නොදැමීම/ සදාචාර විරෝධී ක්‍රියා නොකිරීම/ අන් අයගේ කටයුතුවලට බාධා නොකිරීම/ අනවසරයෙන් ඡායාරූප නොගැනීම/ බුද්ධිමය දේපළ සොරකම් නොකිරීම/ ඡායාරූප අනවසරයෙන් හුවමාරු නොකිරීම. | **විස්තර කිරීමට පමණි**<br>ලකුණු 1 × 4 = 4<br>**(නම් කිරීමට ලකුණු නොමැත.)** |

**(05) ප්‍රශ්නය (ලකුණු 10)**

| | | |
|---|---|---|
| (1) | **එකඟ වේ.** ජංගම (ස්මාර්ට්) දුරකථනය හා අන්තර්ජාලය ඒකාබද්ධව ගුවන්විදුලිය/ පුවත්පත/රූපවාහිනිය ඒකාබද්ධ වී ඇත. | **සනාථ කිරීමට පමණි**<br>ලකුණු 1/ 0 |
| (2) | **එකඟ වේ.** ආකෘති වෙනස/ ගලා යෑමේ වේගය/ නීත්‍යානුකූලබවේ වෙනස/ කුතුහලය දිනාගැනීමේ වෙනස/ ලැබෙන කරුණුවල නිශ්චිත බවේ වෙනස පැහැදිය යුතුය. | **පැහැදිලි කිරීමට පමණි**<br>ලකුණු 1 × 2 = 2 |
| (3) | **එකඟ නොවේ -** පුද්ගල/ ආයතනික/ ලිඛිත/ මාධ්‍ය යන මූලාශ්‍ර හතරෙන්ම තොරතුරු ලබාගනී. (මූලාශ්‍ර වර්ග කරුණු ලෙස සලකන්න.) | **පෙන්වාදීමට පමණි**<br>ලකුණු 1 × 3 = 3 |
| (4) | **එකඟ නොවේ.** ශ්‍රව්‍ය මාධ්‍යයක් වීම/ පරිකල්පනය අවශ්‍ය වීම/ කෙටි ව්‍යවහාර භාවිතය/ සරල අදහස් ප්‍රකාශය/ වියදම් අඩු මාධ්‍යයක් වීම. **ගුවන්විදුලිය** ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වීම/ සමීප මාධ්‍යයක් වීම/ සජීව මාධ්‍යයක් වීම/ අස්ථායි මාධ්‍යයක් වීම/ වියදම් අධික මාධ්‍යයක් වීම **රූපවාහිනිය** | **සනාථ කිරීමට පමණි**<br>ලකුණු 1 × 4 = 4<br>**(සංසන්දනාත්මකව පිළිතුර ගොනු කළ යුතුය.)** |

**(06) ප්‍රශ්නය (ලකුණු 10)**

| | | |
|---|---|---|
| (1) | ඇක්ටා ඩියුර්නා නම් රාජ්‍ය නිවේදනය/ ඉයෝමියුරි/ කවර බාන් මැටි පුවරුව U.K වල අතින් ලියන ලද පුවත් ලිපි/ රුසියාවේ courant නම් අතින් ලියූ පුවත්පත/ ප්‍රවෘත්තිමය අවශ්‍යතා සඳහා භාවිත මැටි/ ඉටි ගාන ලෑලි | **නම් කිරීමට**<br>ලකුණු 1/2 × 2 = 01 |
| (2) | ශ්‍රමය ඉතිරිවීම/ වැඩි පිටපත් ප්‍රමාණයක් ලබාගැනීමට හැකිවීම/ කාලය ඉතිරිවීම ලේඛන දෝෂ අවම වීම/ ආකර්ශණීය නිමාව | **කෙටියෙන් විස්තර පමණි.**<br>ලකුණු 1 × 2 = 02 |
| (3) | පුවත්පත් ආයතනයේ දැක්ම හඳුනාගැනීමට/ ජනමත ගොඩ නැගීමට හැකිවීම. පුවත්පත් ආයතනයේ ප්‍රතිපත්ති හඳුනාගැනීමට/ සමාජ - දේශපාලන පරිසරයේ නව මතවාද දැනගැනීමට/ කාලීන වැදගත්කම් සහිත වීම/ සම්මත ලේඛන රටා හඳුනාගැනීමට/ ජනතාවට වැදගත් කරුණු අවධාරණයට හැකි වීම. | **නම් කිරීමට පමණි.**<br>ලකුණු 1/2 × 3 = 1 1/2<br>**විස්තර කිරීමට පමණි**<br>ලකුණු 1 × 3 = 03 |
| (4) | ක්ෂණික පුවත් දැනගැනීමේ හැකියාව/ ගබඩා කරගැනීමේ පහසුව/ නැවත නැවත කියවීමට හැකිවීම/ තොරතුරු විෂයන් අනුව වර්ග කරමින් පළ කොට තිබීම/ යාවත්කාලීන කිරීමේ පහසුකම් වැඩිවීම/ ක්ෂණික පාඨක ප්‍රතිචාර හිමිවීම. | **විස්තර කිරීමට පමණි.**<br>ලකුණු 1 × 4 = 4 |

**(07) ප්‍රශ්නය (ලකුණු 10)**

| | | |
|---|---|---|
| (1) | සම්මුඛ සාකච්ඡා/ ප්‍රශ්නාවලිය/ නිරීක්ෂණය/ ලේඛණ පරිශීලනය/ බුද්ධිකලම්බනය | **නම් කිරීමට** ලකුණු 1/2 × 2 = 01 |
| (2) | අධ්‍යානය/ විනෝදය/ පෙළඹවීම/ මහජන සේවය/ වාණිජ අරමුණු තොරතුරු/ ලාභය | **කෙටි පැහැදිලි කිරීමට** ලකුණු 1/2 × 4 = 2 |
| (3) | **ආමන්ත්‍රණ ස්වරූපය** = ලිවිය යුත්තේ එක් පුද්ගලයෙකු අරභයා ය. එනම් පුද්ගලික ඇමතුමකි. එය ඔබ හා මම අතර කෙරෙන්නෙකි. මෙම ආමන්ත්‍රණය මිත්‍රශීලී විය යුතුය.<br><br>**ශ්‍රවණ ස්වරූපය** = ඇසෙන්නේ එක් වරක් පමණි. එහෙයින් ඇසූ මුල් අවස්ථාවේදීම අසන්නාට තේරුම් යා යුතුය.<br><br>**ශබ්ද ස්වරූපය** = යොදාගන්නේ ශබ්දය පමණක් බැවින් ශබ්දය මඟින් සියලු දේ අන්ධයෙකුට කියන්නාක් සේ මනසේ චිත්‍රණය විය යුතුය. | **ස්වරූප තුන වෙන වෙනම පැහැදීමට** ලකුණු 1 × 3 = 03 |
| (4) | සමාජානුයෝජන රටා වෙනස් වීමට/ බටහිරකරණයට යොමුවීම/ ප්‍රචණ්ඩත්වයට හා කාමුකත්වයට යොමුවීම/ අධ්‍යාපන ලැබීම/ සෞන්දර්ය කලාවට යොමුවීම/ අධිපාරිභෝනයට පෙළඹවීම/ ස්වදේශීය අන්තර් ඥානය වාදනය | **විස්තර කිරීමට** ලකුණු 1 × 4 = 4 |